"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary } දුරකථන / தொலைபேசி / Telephone - 011-2092599; ෆැක්ස් / பெக்ஸ் / Fax - 011-2092601; ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk

සාමාන්‍ය දුරකථන / தொலைபேசி / General Telephone } 011-2093000

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. | CSWP/ADM/10-43/FI/01 | ඔබේ අංකය. / உமது இல. / Your No. | | දිනය. / திகதி. / Date. | 2019.04. 01 |

<u>පාලන චක්‍රලේඛ අංක 02/2019</u>

බස්නාහිර පළාත් සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

<u>ප්‍රඥප්ති කෙටුම්පත්කරණය සහ බස්නාහිර පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.</u>

පළාත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු යටතේ මෙන්ම පළාත් අමාත්‍යාංශ යටතේ වන ව්‍යවස්ථාපිත ආයතන විසින් කෙටුම්පත් කරනු ලබන ප්‍රඥප්ති හෝ සංශෝධිත ප්‍රඥප්ති බස්නාහිර පළාත් සභාවේ අනුමැතිය සඳහා යෝජනා කිරීමට පූර්වයෙන් පහත සඳහන් ක්‍රියාපටිපාටිය යටතේ කටයුතු කළ යුතු බව අවධාරණය කරමි.

(අ). අදාල විෂය සම්බන්ධව නව ප්‍රඥප්තියක් සම්මත කිරීම සම්බන්ධයෙන් හෝ දැනට පවත්නා ප්‍රඥප්තියක් පරිච්ඡින්න කර නව ප්‍රඥප්තියක් සැකසීම සම්බන්ධයෙන් හෝ පවත්නා ප්‍රඥප්තියක් සංශෝධනය කිරීමට අදාලව විෂය අයත් අමාත්‍යාංශය භාර ගරු පළාත් අමාත්‍යතුමා විසින්, පළාත් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් කරුණට අදාල ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා ගැනීම.

(ආ). අදාල පළාත් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නව ප්‍රඥප්ති කෙටුම්පත හෝ සංශෝධිත ප්‍රඥප්ති කෙටුම්පත සකස් කිරීම.

(ඇ). සකස් කරන ලද ප්‍රඥප්ති කෙටුම්පත හෝ සංශෝධන ප්‍රඥප්ති කෙටුම්පත බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයෙහි නීති අංශය යටතේ කටයුතු කරන තම අමාත්‍යාංශයට අදාල නීති නිලධාරීන් වෙත හෝ ව්‍යවස්ථාපිත අධිකාරියක් නම් එම අධිකාරියේ කටයුතු කරන නීති නිලධාරී වෙත යොමු කර සකස් කර ඇති ප්‍රඥප්ති කෙටුම්පතෙහි ව්‍යවස්ථානුකූලභාවය හා නිවැරදිතාවය පිළිබඳ නීති මතයක් ලබා ගැනීම හා ඒ අනුව සකස් කිරීම.



| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி பயிற்சி / Personnel & Training | මුදල් / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel: 011-2092606<br>Fax: 011-2092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel: 011-2092631<br>Fax: 011-2092647<br>dcspt@cs.wpc.gov.lk | Tel: 011-2092640<br>Fax: 011-2092636<br>csfinance@wpc.gov.lk | Tel: 011-2092532<br>Fax: 011-2092533<br>dcsplan@wpc.gov.lk | Tel: 011-2092501<br>Fax: 011-2092505<br>dcseng@wpc.gov.lk | Tel: 011-2092628 |

(ඈ). අදාල අමාත්‍ය මණ්ඩල තීරණයෙහි හා අදාල නීති නිලධාරිගේ නීති මතයේ ද පිටපතක් සහිතව සකස්කර ඇති ප්‍රඥප්ති කෙටුම්පත හෝ සංශෝධිත ප්‍රඥප්ති කෙටුම්පත බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රඥප්ති කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා යොමු කිරීම.

(ඉ). ප්‍රධාන ලේකම් කාර්යාලයෙහි ප්‍රඥප්ති කමිටුව විසින් අවසන් වශයෙන් සලකා බලන ලදුව, අදාල ප්‍රඥප්ති කෙටුම්පත හෝ සංශෝධිත ප්‍රඥප්තිය අදාල අමාත්‍යාංශය වෙත නැවත යොමු කිරීමෙන් පසු ව්‍යවස්ථාපිත කාර්ය පටිපාටිය ආරම්භ කිරීමට පූර්වයෙන්, බස්නාහිර පළාත් සභා කාර්ය පරිපාටි රීති යටතේ මහජනයාගේ දැන ගැනීම සඳහා ගැසට් පත්‍රයක් යටතේ නිවේදනය කිරීම.

(ඊ). අදාල ප්‍රඥප්ති කෙටුම්පත හෝ සංශෝධිත ප්‍රඥප්ති කෙටුම්පත 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 24 වන වගන්තියෙහි සඳහන් විධිවිධානයන්ට අදාල ප්‍රඥප්ති කෙටුම්පතක් හෝ සංශෝධිත ප්‍රඥප්ති කෙටුම්පතක් වේ නම්, ඒ අනුව එකී විධිවිධාන යටතේ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නිර්දේශය ලබා ගැනීම සඳහා බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම් මගින් බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් වෙත යැවීම.

(උ). ඉහත පියවර යටතේ කටයුතු කිරීමෙන් අනතුරුව අදාල ප්‍රඥප්ති කෙටුම්පත හෝ සංශෝධිත ප්‍රඥප්ති කෙටුම්පත පළාත් සභාවේ අනුමැතිය සඳහා ගරු පළාත් විෂයභාර අමාත්‍යතුමාගේ යෝජනාවක් සමඟ බස්නාහිර පළාත් සභා ලේකම් වෙත යොමු කිරීම.

(02). ඉහත කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කර කටයුතු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඔබ අමාත්‍යාංශය යටතේ සියළු දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත අධිකාරීන්හි ප්‍රධානීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

(03). තවද, ඉහත උපදෙස් පටිපාටිය කෙරෙහි අවධානය යොමු කිරීමකින් තොරව ප්‍රඥප්ති සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුවුවහොත් එමගින් සිදුවන අයහපත් ප්‍රතිඵල සම්බන්ධයෙන් ප්‍රඥප්ති කමිටුව වගකීමට නොබැඳෙන බවද අවධාරණය කරමි.

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම්.
බස්නාහිර පළාත.